රාජ්‍ය පරිපාලන,
චක්‍රලේඛ අංක: 33/89

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1989 මැයි මස 2[illegible] දා.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන්,
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් හා
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන් වෙතටයි.

1988 අංක. 39 දරන අදේශිකයන්ට පුරවැසිභාවය
<u>ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත.</u>

1988 අංක 39 දරණ අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ අඩංගු විධිවිධාන සම්බන්ධයෙන් ඔබේ අවධානය යොමු කළයුතුව තිබේ.

02. මෙම පනතේ 2 වගන්තිය අනුව, වෙනත් යම් නීතියක කවර විධි විධානයක් තිබුණද,—

(අ) ඉන්දීය සම්භවය ඇත්තාවූද නීත්‍යානුකූලව ශ්‍රී ලංකාවේ වාසයට සිටින්නාවූද,

(ආ) අදේශිකයන් වන්නාවූද,

(ඇ) 1986 අංක 5 දරණ අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනතේ සඳහන් වන්නාවූද, ඉන්දියානු පුරවැසි බව ලබාගැනීම සඳහා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයෙන් ඉල්ලුම් කර ඇත්තාවූද, 5,06,000 තැනැත්තන්ට සහ 1964 ඔක්තෝම්බර් 30 වන දිනට පසුව ඒ අයට ඉපදුණ දරුවන් අතරට ඇතුළත් නොවන්නාවූද,

සෑම තැනැත්තෙකුටම මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපවත්වන පරිදි ශ්‍රී ලංකා පුරවැසි තත්ත්වය හිමි වන්නේය.

මෙම පනත බලපැවැත්වූයේ 1988.11.11 දින සිටය. මෙම පනත අනුව ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන සෑම තැනැත්තෙක්ම, ශ්‍රී ලංකාවේ අනෙකුත් පුරවැසියන්ට නීතිය අනුව හිමිකම් ඇති සියලු අයිතිවාසිකම් වලට හා වරප්‍රසාදවලට හිමිකම් ලබයි.

03. ශ්‍රී ලංකා රජය, 1988 අංක 39 දරණ පනත ප්‍රකාශයට පත් කිරීමෙන් ඉන්දියානු පුරවැසි බව ලබාදීමට ඉන්දියානු රජය විසින් එකඟවූ පුද්ගලයන් 5,06,000 දෙනා හැර යටත් අනෙකුත් පුද්ගලයන්ට ශ්‍රී ලංකා පුරවැසිභාවය ලබාදී ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයන්ගේ අදේශිකභාවය පිළිබඳ ප්‍රශ්නය විසඳා ඇත. ඉන්දියානු රජය පුද්ගලයන් 4,22,000 කට දැනටමත් පුරවැසිභාවය ලබාදී ඇති අතර, ඉතිරි 84,000 ටද ඉන්දියානු පුරවැසිභාවය ප්‍රදානය කොට ඔවුන් ඉන්දියාවට පෙරළා යැවීම පිළිගෙන ඇත.

04. මෙම පණතේ විධිවිධාන ගැන ඇතැම් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා සංස්ථා දැන නොසිටින්නට පුළුවන. ඒ නිසා මෙම චක්‍රලේඛයෙන් අදහස් කරන්නේ පූර්වෝක්ත පණතේ විධිවිධාන ගැන සියළුම නිලධාරීන්ට අවබෝධයක් ලබාදී පණතින් ආවරණය වන පුද්ගලයන්ට විශේෂයෙන්ම මතු දැක්වෙන කරුණු සම්බන්ධයෙන් කිසියම් අශක්නුතාවක් ඇතිවීම වැලැක්වීමටය.

(අ) මැතිවරණ ඡන්දය දීමේ අයිතිවාසිකම් ඡන්ද දායකයන් ලෙස ලියාපදිංචි වීම.

(ආ) පාසැල්වලට හා විශ්ව විද්‍යාලවලට ඇතුලත් කිරීම හා ශිෂ්‍යත්ව ලබාගැනීම.

(ඇ) ඉඩම් නිවාස හා දේපළ අත්කර ගැනීම, ඉඩම් පවරාදීම හා ඉඩම් හා සම්බන්ධ වෙනත් කරුණු.

(ඈ) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා.

(ඉ) ව්‍යාපාර ලියාපදිංචි කිරීම, ආනයන හා අපනයන, කෘෂිකාර්මික හා කාර්මික ව්‍යාපාර.

(ඊ) හැඳුනුම්පත් හා ගමන් බලපත්‍ර ආදිය.

05. මෙම පණතේ විධිවිධාන අනුව ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන කවර හෝ පුද්ගලයකුට ඔහුගේ කැමැත්ත පරිදි, මෙම පණතේ 4 (1) වගන්තිය යටතේ ඉන්දියානු සම්භවය ඇති තැනැත්තන් ලියා පදිංචි කිරීමේ කොමසාරිස්ගෙන් පුරවැසි සහතිකයක් ලබාගත හැකිය. එසේවුවද මෙම පණතේ 4 (4) වගන්තියේ නියමයන් අනුව කවර හෝ කරුණක් සඳහා කිසිම තැනැත්තෙකු විසින් පුරවැසි සහතිකය ඉදිරිපත් කිරීමට නියම නොකළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරෙන දිවුරුම් සහතිකයක් එහි සඳහන් කරුණු පිළිබඳ බැලූ බැල්මට පිළිගැනෙන සාක්ෂියක් වශයෙන් භාරගත යුතුය.

06. මෙම පණත අනුව පුරවැසිභාවය ලබන පුද්ගලයන් සෑම කරුණක් සම්බන්ධයෙන්ම ශ්‍රී ලංකා පුරවැසියන් වශයෙන් පිළිගැනෙන පරිදි ඉහත කී පණතේ විධිවිධාන කෙරෙහි ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/සභාවේ, සියළුම නිලධාරීන්ගේ අවධානය යොමු කරවන ලෙස නියෝග කරනු ලැබේ.

(සිරිල් ගමගේ)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

සු/-